# ජාතික රාජ්‍ය සභාවේ
# 1975 අංක 15 දරන සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 15 දරන සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 26/74

## සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියට සම්බන්ධ සියලු කටයුතු එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව ඵලදායී ලෙස කර ගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි පිහිටුවා තිබුණු හෙයින් ද :

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 15 දරන සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඊට පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින යම් හා සිටින තාක් තැනැත්තන් ද මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් ද "සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවක් විය යුතු අතර එකී නාමයෙන් පොදු මුද්‍රාවක් තබා ගෙන පාවිච්චි කිරීමේ ද එහි අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇති ව සියලු අධිකරණයන්හි සංස්ථාව විසින් නඩු පැවරීම හා එයට විරුද්ධ ව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) සිරි අනුරාධපුර බැස්ටියන් විශ්‍රාම ශාලාව පිහිටුවනු ලැබුවේ යම් අරමුණු හා පරමාර්ථ සඳහා ද ඒ අරමුණු හා පරමාර්ථ අනුව සහ වර්ෂ පනහක කාලය තුළ එකී විශ්‍රාම ශාලාව පවත්වා ගෙන එනු ලැබූ පදනම වූ බෞද්ධ මූල ධර්ම ප්‍රායෝගික වශයෙන් පිළිපැදීම සුරක්ෂිත කිරීම පිණිස එකී

ඒ 06825—9,019 (74/05)

විශ්‍රාම ශාලාව බෞද්ධ මහාජනයාගේ ආධාර ඇතිව කාර්යක්ෂම ව නඩත්තු කිරීම හා කළමනාකරණය කිරීම ;

(ආ) සංස්ථාවේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය කමිටුව සතු කිරීම ;

(ඇ) විශ්‍රාම ශාලාවට පැමිණෙන බෞද්ධ සංඝයා වහන්සේලා හා වන්දනාකරුවන්ට සියලු පහසුකම් සැපයීම සහ විශ්‍රාම ශාලාවට පැමිණෙන සියලු නැනැත්තන්ගේ සිත් තුළ ශ්‍රද්ධා භක්තිය වඩවාලීමේ අදහසින් බෞද්ධ කටයුතු සංවිධානය කිරීම හා මෙහෙයවීම ;

(ඈ) අනුරාධපුරයෙහි දන්දීම්, බෞද්ධ රැස්වීම් හා උත්සව වැනි පුණ්‍ය කටයුතු ඉටු කිරීමෙහි ලා කමිටුවේ වැඩිදෙනාගේ කැමැත්ත ඇතිව සහභාගිවීම හා ඒවාට සහායවීම.

**කමිටුව.**

4. (1) සංස්ථාවේ කටයුතු, මෙහි මින් මතු විධිවිධාන සලසනු ලබන පරිදි සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීති අනුව තෝරා පත් කර ගනු ලබන කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කමිටුව මේ පනත ආරම්භ වන දිනයෙහි ධුරයෙහි සිටින සමිතියේ කමිටුව විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

5. (1) සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී එකී රැස්වීමට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ලත් සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකකවත් ඡන්දයෙන්, කටයුතු කිරීමේ ක්‍රියා පටිපාටිය සඳහා නැතහොත් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ ඉටු කිරීම සඳහා සාමාන්‍ය වශයෙන් සංස්ථාව විසින් කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සාදනු ලැබූ විට ඒ හා සමාන රැස්වීමකදී, (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(2) තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කර ගනු ලබන යම් රීතියක් වෙනස් කිරීම, එවැන්නකට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම, සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ලත් සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් විනා හා ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳ ව යටත් පිරිසෙයින් සති දෙකකටවත් කලින් දැන්වීමක් සාමාජිකයන් වෙත නරනු ලැබුවේ නම් මිස නොකළ යුතු ය.

(3) මේ පනත ආරම්භ වූ දිනයෙහි බලපවත්නා සමිතියේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

6. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පවත්නා සමිතියේ සියලුම ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, සමිතියට අය විය යුතු සියලුම ණය හා ගෙවනු ලැබිය යුතු සම්මාදම් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු ණය හා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ණය.

7. කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී විනා සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර එකී සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් තමන්ගේ නම් සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට අතිරේකව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබීමේ ක්‍රියා පටිපාටිය.

8. යම් මිළට ගැනීමක, ප්‍රදානයක, ත්‍යාගයක, තෙස්තමේන්තු බුදල් බැහැර කිරීමක අයිතියකින් හෝ අන් ආකාරයකින් යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමේ හා දැරීමේ හැකියාව හා ශක්තතාව සංස්ථාවට තිබිය යුතු අතර මේ පනතේ කාර්යයන් සඳහා සහ එකී සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් ව එකී සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ සියලු බලතල ඇතිව සංස්ථාව විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. මේ පනතේ සඳහන් රාජ්‍ය මණ්ඩල, සංස්ථා හෝ තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන්ගේ මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් කිසි තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බල පෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ වෙනත් රාජ්‍ය මණ්ඩලවල/හෝ සංස්ථාවල අයිතිවාසිකම් අන් හැරීම.